**ශීර්ෂය - 294 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය - 294 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වෙන් කළ ප්‍රතිපාදනවලින් රු.527,920 ක් වැය කර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සිදු කර එම අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | අදාළ වැය විෂය යටතේ ප්‍රතිපාදන වෙන් නොකිරීම නිසා ඇති වූ මෙම තත්ත්වය 2023 වර්ෂයේ සිට නිවැරදි කර ගන්නා බව. | අවශ්‍යතාවයන් හඳුනාගෙන නිවැරදි වැය විෂයය යටතේ ප්‍රතිපාදන වෙන්කර ගෙන වියදම් දැරිය යුතුය. |

#### (ආ) තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ACA 4 ආකෘතියේ සඳහන් අවසාන තැන්පතු ශේෂය සමාලෝචිත වර්ෂයේ එම ආකෘතියේ ආරම්භක ශේෂය සමඟ සැසඳීමේදී, අංක 6000-0-0-16-74 දරන කොන්ත්‍රාත් රැඳවුම් මුදල් රු.210,989 ක් වැඩියෙන් ද, අංක 6000-0-0-18-81 දරන ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් රු.2,130 ක් අඩුවෙන් ද දක්වා තිබුණි. | මෙම තත්ත්වය පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මඟින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගැලපීමට කටයුතු කළ යුතුය. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් උප ආයතන තුළ වෙන් වෙන් වශයෙන් හානි හා පාඩු ලේඛන පවත්වා ගන්නා බව. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් ප්‍රධාන කාර්යාලය විසින් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මඟින් සමාලෝචනය කරනු ලබන බව හා ඊට අදාළ වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්තිය | 3,652,371 | මියගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.478,872 ක්, විශ්‍රාම ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් රු.999,225 ක්, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 17 දෙනෙකුගෙන් රු.932,925 ක් හා වැඩ තහනම් කර ඇති නිලධාරීන් 18 දෙනෙකුගෙන් රු.1,241,349 ක් වශයෙන් එකතුව රු.3,652,371 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එයින් රු.1,104,071 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟ හිටව පැවතුණි. | මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය සම්බන්ධයෙන් අදාළ තොරතුරු හා උරුමකරුවන් සොයා ගැනීමේ දුෂ්කරතාවය මත එම ණය අයකර ගැනීමට නොහැකි වී ඇති බව සහ අනෙකුත් ණය මුදල් විශ්‍රාම පාරිතෝෂික මුදල්වලින් ද, විනය පරීක්ෂණ තීරණය අනුව හා නඩු පැවරීම මඟින් මඟින් ද අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | හිඟ හිටි ණය ශේෂ සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කරමින් කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(2) | 35,044,824 | ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට හෝ අදාළ ගිණුමට බැරකළ යුතු වුවද, තැන්පතු ගිණුම් තුනකට අදාළ වර්ෂ 02 ක් ඉක්ම වූ වටිනාකම රු.34,820,423 ක තැන්පතු 138 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. තවද, ඉකුත් වූ තැන්පතු පිළිබඳව අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙල කිරීමට ද කටයුතු කර නොතිබුණි. | දින 30ක් ඇතුළත හිමිකම් පෑම සිදුකරන ලෙස අදාළ ආයතන වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කරමින් පවතින බව හා අක් මුදල් නොමැතිකම මත රු.11,020,672 ක මුදලක් ගෙවීම් කිරීමට නොහැකි තත්ත්වයක් පැන නැඟී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර තැන්පතු ශේෂ නිරවුල් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ ආරම්භ කළ පින්නවල සත්වෝද්‍යානයේ වානර දූපතෙහි ඉදිකිරිම් කටයුතු 2021 වර්ෂය වන විට සම්පූර්ණයෙන් නිම කර තිබුණ ද, වසරකට අධික කාලයක් එම පරිශ්‍රයට සතුන් (වානරයන්) මුදා නොහැර නිෂ්කාර්යව පැවතුණි. | දැනට එම අරණ සඳහා රැගෙනවිත් ඇති වානර විශේෂ හුරු කිරීමේ කටයුතු සිදු කරනු ලබන බව හා විදේශීය වානර විශේෂ ලබා ගැනීම සඳහා විදේශීය සත්වෝද්‍යාන සමඟ සාකච්ඡා සිදුකරමින් පවතින බව. | පරිශ්‍රයට සතුන් ඇතුළත් කර ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ රු.176,281,496 ක ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් සඳහා එළැඹ තිබූ ගිවිසුම් පරිදි එම ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණය පරිදි එම ව්‍යාපෘතිවලට අදාළ කොන්ත්‍රාත්තු අවසන් කර තිබුණ ද, අතර මඟ නවතා දමා තිබුණු එම ව්‍යාපෘති නැවත නව කොන්ත්‍රාත්කරුවකුට ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ඉදිකිරීම් | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ඉදිකිරීම් කටයුතු නවතා දැමීම හේතුවෙන් වැඩ අවසන් කරන ලද ව්‍යාපෘතිවලින් අයකර ගත යුතු මුදල්, රඳවා තබා ගැනීම් සහ නොගෙවූ අවසන් බිල්පත් වලින් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. එක් ව්‍යාපෘතියක ඉතිරි කටයුතු සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව හරහා ඉටු කර ගැනීමට කටයුතු කළ නමුත් රට තුළ පවතින ආර්ථික තත්ත්වය හමුවේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවීමට සිදුවූ බව. | වැය කළ මුදල් නිෂ්කාර්ය වියදම් බවට පත්වීමට ඉඩ නොහැර නිවැරදි වැඩ පිළිවෙලක් අනුගමනය කළ යුතු අතර හිඟ හිටි මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් දරන ලද රු.69,558,270 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. ඉන් ව්‍යාපෘති 04 ක් සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දී තිබූ වැඩ මූලික අත්තිකාරම් (Mobilization Advance) මුදලෙන් රඳවා ගැනීම් මුදල් ගැලපීමෙන් පසු රු.14,360,310 ක මුදලක් තව දුරටත් අය කර ගත යුතුව තිබුණි. | | |
| (ආ) | 2018 වර්ෂයේ ඉදිකිරිම් කටයුතු ආරම්භ කර තිබූ පින්නවල සත්වෝද්‍යානයට අයත් මෝදරවත්ත රථ නැවතුම්පළේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකර 2020 වර්ෂයේදී අතර මඟ නවතා දමා තිබුණු අතර ඉදි කෙරෙමින් පැවති මුර කුටිය හා වැසිකිළි පද්ධතිය වල් බිහිවී විනාශ වෙමින් පැවතුණි. | මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීමේ දී මතු වූ කළුගල් යන්ත්‍ර සූත්‍ර භාවිතා කර ඉවත් කිරීමට නොහැකි තත්ත්වයක් මත ව්‍යාපෘතියේ ඉතිරි ඉදිකිරීම් කටයුතු අනෝන්‍ය වශයෙන් අවසන් කර ඇති බව හා මේ වනවිට සකස් කරන ලද කොටසෙහි කුඩා රථ වාහන නැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | මුර කුටිය හා වැසිකිළි පද්ධතිය මනාව නඩත්තු කර භාවිතයට ගැනීමටත්, නිමකළ කොටස් ප්‍රයෝජනවත් ආකාරයට යොදා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේදී ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ පින්නවල සත්වෝද්‍යානයේ සමනල පර්යේෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල හා වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේ සිට අතරමඟ නවතා දමා තිබුණු අතර වැසිකිලි පද්ධතියෙහි ගොඩනැගිලිවල වල්බිහිවී විනාශ වෙමින් පැවතුණි | 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම අනුව පින්නවල සත්වෝද්‍යානයේ සමනල පර්යේෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල හා වැසිකිලි පද්ධතියේ ඉතිරි වැඩ අවසන් කිරිම සඳහා යෝජනා කර ඇති අතර ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන හා අක් මුදල් ලැබෙන ආකාරයට මෙම ඉදිකිරීම අවසන් කිරීමට බලාපොරොත්තු වන බව. | ඉදි කිරීම් කටයුතු නිම කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අක්කර 17 ක පමණ වපසරියකින් යුතු වාගොල්ල හේන නොහොත් පින්නලන්ද වත්ත නමැති ඉඩම පින්නවල අලි අනාථාගාරායට පවරා ගෙන මාස 08 ක කාලයක් ගත වී තිබුණු නමුත් ඉඩමේ මායිම් ලකුණු කර ඉඩම ආරක්ෂා කර ගැනීමටත් අදාළ අරමුණු ඉටුකර ගැනීමටත් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | එම ඉඩමෙහි එක් කොටසක් වටා කම්බි වැට ඉදිකිරීම සිදුකර ඇති අතර පවතින ප්‍රතිපාදන හා අක් මුදල් කළමනාකරණය කර ගනිමින් අනෙක් කොටස්වල කම්බි වැට ඉදිකිරිමට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීමට කටයුතු කරන බව. | ඉඩම ආරක්ෂා කර ගැනීමටත්, භාවිතයට ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට 887 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු 163 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 01 ක් හා තෘතියික සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 156 ක් පුරප්පාඩු වී පැවතුණි. | රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීමේ චක්‍රලේඛය අනුව නව බඳවා ගැනීම් සිදුකිරීමට නොහැකි බැවින් උක්ත තනතුරු පුරප්පාඩු ලෙස පැවතුණු බව. | රෙගුලාසිවලට අනුගත වෙමින් පුරප්පාඩු පුරවා ගැනීමට හෝ පවතින සේවක සංඛ්‍යාව මත කටයුතු කළමනාකරණය කර ගැනීමට ඇති හැකියාව පිළිබඳව සමාලෝචනය කර අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාථමික සේවා ගණනයට අයත් ක්ෂේත්‍ර සහායක තනතුරු 10 ක අතිරික්තයක් පැවතුණි. | ක්ෂේත්‍ර සහකාර තනතුරු අතිරික්ත සංඛ්‍යාව පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරනු ලබන බව, | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |